# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 1784/25 – 2012 නොවැම්බර් 16 වැනි සිකුරාදා – 2012.11.16**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ යොමු අංකය: අයිආර්/10/32/2009.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 1771/3 දරන හා 2012.08.13 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධියට පත්කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් කැළණිය, පට්ටිය හන්දිය, කේ. ජේ. පීරිස් මාවතේ අංක 681/20ඒ හි පදිංචි පී. සුනිල් සිල්වා මහතා හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 15, ශ්‍රීමත් රාමනාදන් මාවත, අංක 178 හි සිලෝන් ටුබැකෝ කම්පැනි පී. එල්. සී. අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක ඒ 3325 දරන හා 2012.07.19 දිනැති ප්‍රදානය අවලංගු කරන ලෙසට පී. සුනිල් සිල්වා මහතා වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20 (1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක ඒ 3325 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2013.08.13 දින සිට අවසන් වන බවට පනතේ 20 (2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
කම්කරු කොමසාරිස්.

2012 නොවැම්බර් මස 07 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

පළමුවන උපලේඛනය
'අ' ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

## 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත

## බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම

ලිපිනය : 681/20ඒ, කේ. ජේ. පීරිස් මාවත, කැළණිය.
දිනය : 2012.10.26.

කම්කරු කොමසාරිස් වෙතටය.

2012.08.13 දිනැති අංක 1771/3 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දාවූ පී. සුනිල් සිල්වා සහ සිලෝන් ටුබැකෝ කම්පැනි (පී.එල්.සී.) අංක 178 ශ්‍රීමත් රාමනාදන් මාවත, කොළඹ 15. බැඳීසිටින්නාවූ ද 2012.07.19 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අත්සන

(පී. සුනිල් සිල්වා)

පිටපත්,
1. සිලෝන් ටුබැකෝ කම්පැනි (පී. එල්. සී.)
අංක 178, ශ්‍රීමත් රාමනාදන් මාවත,
කොළඹ 15.

11-1140

---

මගේ යොමු අංකය: ඩබ් 105/30/2004(උප).

## කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2005.10.18 දින දරන නියෝගයෙන් බේරුම්කිරීම මඟින් විසඳීම සඳහා යොමු කරනු ලැබූ රාජගිරිය, වැලිකඩ, ශ්‍රී ජයවර්ධනපුර මාවත, අංක 60 හි ජාතික වතු සේවා සංගමය සහ තලවකැලේ, සෙන්ට් කූම්බස් හි පිහිටි ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය හා රත්නපුර සෙන්ට් ජෝකිම් වත්ත, වතු අධිකාරි අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් මා වෙත ලබා දෙන ලද අංක ඒ 3142 දරන ප්‍රදානය 2008.06.26 දිනැති හා අංක 1555/21 දරන රජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලදී.

එම ප්‍රදානය සම්බන්ධයෙන් කාර්මික ආරාවුල් පනතේ 34 වගන්තිය යටතේ බේරුම්කරු විසින් මා වෙත ලබා දී ඇති 2012.09.22 දිනැති අර්ථ නිරූපනය එම පනතේ 18 (1) වගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**වී. බී. පී. කේ. වීරසිංහ,**
**කම්කරු කොමසාරිස්.**

2012 නොවැම්බර් මස 07 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

## කොළඹ කාර්මික අධිකරණයේදීය

ජාතික වතු සේවා සංගමය, අංක 60, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය,

නඩු අංක ඒ 3142 ඉල්ලුම්කරු
එරෙහිව

1. ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය, සෙන්ට් කූම්බස්, තලවකැලේ.

2. වතු අධිකාරි සෙන්ට් ජෝකිම් වත්ත, රත්නපුරය

අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධවයි.

කම්කරු කොමසාරිස් (කාර්මික සම්බන්ධතා) ගේ 2012.09.22 දින ලිපිය ප්‍රකාර අර්ථ නිරූපනය පහත සඳහන් කරමි.

එස්. කේ. එදිරිසිංහ සහ ඒ. ඩබ්. එස්. විමලසිරි පීරිස් යන බේරුම්කරණ තීතී කෘත්‍යයේ ඉල්ලුම්කරුවන් දෙදෙනා සඳහා 2008.06.26 දිනැති ශ්‍රී ලංකා ප්‍රාජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද ප්‍රදානය ක්‍රියාත්මක කළ යුතු දිනය ලෙස අදාළ යොමුව මා වෙත කම්කරු කොමසාරිස්වරයා විසින් එවන ලද 2005.10.07 දිනය ලෙස මම අර්ථ නිරූපනය කොට මෙයින් ඉදිරිපත් කරමි. අදාළ යොමුවෙහි පිටපතක් (සිංහල/ඉංග්‍රීසි) දෙබසින්ම මෙයට යා කොට ඇත.

මෙයට,
එස්. කාරියවසම්,
කාර්මික අධිකරණය,
බේරුම්කරණ මණ්ඩලයේ සාමාජික.

2012.09.22.

11-1141

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.